# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 161 — 1975 අප්‍රේල් 24 වැනි බ්‍රහස්පතින්දා — 1975.04.24

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV වැනි කොටස — පළාත් පාලනය

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)



| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... | 291 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... | 297 |
| තනතුරු-ඇබෑර්තු ... ... | 292 | අය-වැය ලේඛන ... ... | 299 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | 296 | දේපල විකිණීම ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... | 296 | මාර්ග කොමිටි දැන්වීම ... ... | — |
| පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — | විවිධ දැන්වීම ... ... | 302 |



සැ. යු.—ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 17 දරණ සමාජ ශාලා වලට බලපත්‍ර දීමේ පනත 1975 අප්‍රේල් මස 24 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළවේ.

## පළාත් පාලන නිවේදන

පා. පා. දෙ./ආර්. ඒ. 1/9/වි 1/4.

### ගම්සභා ආඥාපනත

#### ආඥාව

(257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 47 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමති, ෆිලික්ස් රෙජිනෝල්ඩ් ඩයස් බණ්ඩාරනායක වන මම, එකී 47 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය කළුතර දිස්ත්‍රික්කයේ අධිකාරි පත්තු ගම් ප්‍රදේශයේ ගම්සභාව සම්බන්ධයෙන් අදාල නොවිය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

ෆීලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමති.

1975 අප්‍රේල් 11 දින,
කොළඹදීය.

4-526 —75.04.24 දින අංක 161 දරණ ගැසට් පත්‍රය

---

### ගම්සභා ආඥාපනතේ 13 වැනි වගන්තිය යටතේ දැන්වීම

1961 අංක 60 දරණ පනතින් සංශෝධිත ගම්සභා ආඥාපනතේ (257 වැනි අධිකාරය) 13(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරුනු බලතල ප්‍රකාර බදුල්ල දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස් තම්බිසාහිබු අසිදුරුස් කමාල්දීන් වන මම රිල්පොල ගම්සභාවේ අංක 12 දරණ කොට්ඨාශයේ නියෝජිත දෙන්නායක මුදියන්සේලාගේ පුංචි බණ්ඩා මහතා සභාවට දැන්වීමක් නොමැතිව පිළිවෙළින් සභා රැස්වීම් වාර තුනකට වැඩි ගණනක් තමන් තෝරා පත් කර ගැනීමෙන් පසු නොපැමිණි බව ගැන සෑහීමකට පත්ව බදුල්ල දිස්ත්‍රික්කයේ රිල්පොල ගම්සභාවේ අංක 12 දරණ කොට්ඨාශයේ සභික දෙන්නායක මුදියන්සේලාගේ පුංචිබණ්ඩා මහතා මේ දැන්වීම ගැසට් පත්‍රයේ පළකිරීමේ දිනයේ සිට තම සභිකත්වය අත්හරින ලද බව මෙයින් ප්‍රකාශ කරමි.

ටී. අයි. කමාල්දීන්,
බදුල්ල පළාත් පාලන සහකාර කොමසාරිස්.

බදුල්ල පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේදී,
1975.04.16 දින දීය.

4-525 —75.04.24 දින අංක 161 දරණ ගැසට් පත්‍රය

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දැක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙලවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් ප්‍රමාද වී ලැබෙන දැන්වීම් භාරගනු නොලැබේ

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1971 මාර්තු මස 19 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

**ගම්සභා ආඥාපනතේ 13 වැනි වගන්තිය යටතේ දැන්වීම**

1961 අංක 60 දරණ පනතින් සංශෝධිත ගම්සභා ආඥාපනතේ (257 වැනි අධිකාරය) 13(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරුනු බලතල ප්‍රකාර බදුල්ල දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස් තම්බිසාහිබු අයිදුරුස් කමාල්දීන් වන මම යටිපලාත ගම්සභාවේ අංක 03 දරණ කොට්ඨාශයේ නියෝජිත ඇස්. ඇම්. මුදලිහාමි මහතා සභාවට දැන්වීමක් නොමැතිව පිළිවෙලින් සභා රැස්වීම් වාර තුනකට වැඩි ගණනක් තමන් තෝරා පත් කර ගැනීමෙන් පසු නොපැමිණි බව ගැන සෑහීමකට පත්ව බදුල්ල දිස්ත්‍රික්කයේ යටිපලාත ගම්සභාවේ අංක 03 දරණ කොට්ඨාශයේ සභික ඇස්. ඇම්. මුදලිහාමි මහතා මේ දැන්වීම ගැසට් පත්‍රයේ පළකිරීමේ දිනයේ සිට තම සභිකත්වය අත් හරින ලද බව මෙයින් ප්‍රකාශ කරමි.

ටී. අයි. කමාල්දීන්,
බදුල්ල පළාත් පාලන සහකාර කොමසාරිස්.

බදුල්ල පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ දී,
1975 අප්‍රේල් මස 08 දින දී ය.

4–493—75.04.24 දින අංක 161 දරණ ගැසට් පත්‍රය

---

**ගම්සභා ආඥාපනත**

**13 වන වගන්තිය යටතේ දැන්වීමයි**

1961 අංක 60 දරණ පනතින් සංශෝධිත (257 වන අධිකාරය වන) ගම්සභා ආඥා පනතේ 13(1) වැනි වගන්තියෙන් මාවෙත පැවරුන බලතල ප්‍රකාර, කොළඹ දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස් හෙළකුමාරගේ පැරකුම් විජේසිංහ වන මම, කොළඹ දිස්ත්‍රික්කයේ කෙහෙල්ඇල්ල ගම්සභාවේ අංක 03 දරණ කොටසේ නියෝජිත, අධිකාරි අප්පුහාමිලාගේ පියසේන මහතා පිළිවෙලින් ගම්සභාවේ රැස්වීම් 03 කට වැඩි ගණනකට තමන් තෝර ගැනීමෙන් පසුව දැන්වීමක් නොමැතිව නොපැමිණි බවට සෑහීමකට පත්ව කොළඹ දිස්ත්‍රික්කයේ, කෙහෙල්ඇල්ල ගම්සභාවේ අංක 03 දරණ කොටසේ නියෝජිත, අධිකාරි අප්පුහාමිලාගේ පියසේන මහතා මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පලවන දිනයේ සිට තම සභිකත්වය අත්හරින ලද බව මෙයින් ප්‍රකාශ කරමි.

හෙ. පැ. විජේසිංහ,
පළාත් පාලන සහකාර කොමසාරිස් (කොළඹ දිසාව).

1975 ක්වූ අප්‍රේල් මස 10 වෙනි දින,
බම්බලපිටියේ,
පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේදිය

4–505—75.05.24 දින අංක 161 දරණ ගැසට් පත්‍රය

---

**ගම්සභා ආඥාපනත**

**17 වෙනි වගන්තිය යටතේ දැන්වීමයි**

1961 අංක 60 දරණ පනතින් සංශෝධිත ගම්සභා ආඥා පනතේ (257 වැනි අධිකාරය) 17(5) දරන වගන්තියෙන් මාවෙත පැවරී ඇති බලතල ප්‍රකාර කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස් හෙළකුමාරගේ පැරකුම් විජේසිංහ වන මම, කොළඹ දිස්ත්‍රික්කයේ උබුගම්පොල ගම්සභාවේ රැස්වීමක් එම ගම් සභාවට සභාපති වරයෙකු තෝරා පත්කර ගැනීම සඳහා උබුගම්පොල ගම්සභා කාර්යාලයේදී 1975.04.23 වෙනි දින පෙ.ව. 10 ට මෙයින් කැඳවා සිටිමි.

හෙ. පැ. විජේසිංහ,
ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස්,
කොළඹ දිසාව.

ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස්,
කාර්යාලය, (කොළඹ දිසාව),
1975.04.04 වන දින දිය.

4–389—75.05.24 දින අංක 161 දරණ ගැසට් පත්‍රය

---

**ගම්සභා ආඥාපනත**

**17(5) වැනි වගන්තිය යටතේවූ දැන්වීමයි**

1961 අංක 60 දරන පනතින් සංශෝධිත ගම්සභා ආඥාපනතේ (257 වැනි අධිකාරය) 17 (5) දරණ වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලයේ ප්‍රකාර බදුල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස්, තම්බිසාහිබු අයිදුරුස් කමාල්දීන් වන මා විසින්, මීට යා කොට ඇති උප ලේඛණයේ I වැනි තීරුවෙන් නියමිත ගම්සභාවේ රැස්වීමක් එකී උප ලේඛණයේ II වැනි තීරුවේ අනුරූප සටහනින් නියමිත දිනයේදී ද, එකී උපලේඛණයේ III වැනි තීරුවේ අනුරූප සටහනින් නියමිත වේලාවටද, එකී උපලේඛණයේ IV වැනි තීරුවෙන් නියමිත ස්ථානයේදී ද, මෙයින් කැඳවා සිටිනු ලැබේ.

ටී. අයි. කමාල්දීන්,
ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස්
බදුල්ල දිස්ත්‍රික්කය.

**උපලේඛණය**

| I වැනි තීරුව ගම්සභාවේ නම | II වැනි තීරුව දිනය | III වැනි තීරුව වේලාව | IV වැනි තීරුව ස්ථානය |
|---|---|---|---|
| රිල්පොල ... | 1975.05.07 ... | පෙ.ව.11.00... | රිල්පොල ගම්සභා කාර්යාලය. |

4–489—75.05.24 දින අංක 161 දරණ ගැසට් පත්‍රය

---

# තනතුරු—ඇබෑර්තු

## ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයෙහි IV වැනි කොටසෙහි පළකෙරෙන පළාත් පාලන සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි

1. **දීමනා.**—රජයේ නිලධාරීන්ට අදාළ වන ප්‍රමාණයන් හා කොන්දේසි අනුව විවාහක දීමනාවක් ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී 1969 අංක 18 දරණ පළාත් පාලන සේවා ජනතාව හා පළාත් පාලන සේවා රෙගුලාසිවලටත්, කොමිෂන් සභාව විසින් කලින් කලට නියම කරනු ලබන අනිකුත් සේවා කොන්දේසිවලටත් යටත් වෙයි.

3. **සේවය භාරගැනීම පිළිබඳ කොන්දේසි.**—(අ) පළාත් පාලන සේවයේ මාසික වැටුප් ගෙවනු ලබන තනතුරුවලට පත්කරනු ලබන සියලු දෙනාම, පළාත් පාලන සේවා අර්ථසාධක අරමුදලට දායක වනු ඇත. මෙම අරමුදලට සේවකයා විසින් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් සියයට 6ක් දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය. අදාළ නිලධාරීතැනගේ ඒකාබද්ධ වැටුපෙන් සියයට 9ක් ඔහු සේවය කරනු ලබන ප්‍රාදේශීය බලමණ්ඩලය විසින් ඔහු වෙනුවෙන් ගෙවනු ලැබේ.

(ආ) ආණ්ඩුව යටතේ සේවය කරන නිලධාරීන්, ආණ්ඩුවේ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවල 21 වන වගන්තිය යටතේ සේවයෙන් මුදාහරිනු ලැබ පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මාරුකරනු ලැබුවහොත් ඔවුන්ගේ විශ්‍රාම වැටුප් අයිතිවාසිකම් ආරක්ෂා වේ. පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන නිලධාරියෙකු එම සේවයේ විශ්‍රාම වැටුප් සහිත වෙනත් තනතුරකට පත්කරන ලද්දේ නම් හෝ උසස් කරන ලද්දේ නම් ඔහු සිය නව තනතුරෙහිද විශ්‍රාම වැටුප් හිමිකම් තවදුරටත් භුක්ති විඳිනු ඇත.

(ඇ) ප්‍රාදේශීය බලමණ්ඩලවල විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථාවේ නියෝග හෝ යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරන සේවකයන් සම්බන්ධයෙන් වූ විට, ඔවුන් අවසානයේදී සේවයෙන් විශ්‍රාම ගැනීමේදී ඔවුන්ට විශ්‍රාම වැටුප් ගෙවීම තීරණය කරනු ලබන්නේ, 1969 අංක 18 දරණ පළාත් පාලන සේවා පනත ප්‍රකාර, පළාත් පාලන සේවයට මාරුකරනු ලැබූ දිනයට කලින් ද ඔවුන් සේවයේ යෙදී සිටි ප්‍රාදේශීය බලමණ්ඩලයෙහි විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථා හා නියෝග අනුවය.

කියවා බලන ලෙස අයදුම්කරුවන්ට අවවාද කරනු ලැබේ. ගැසට් නිවේදනය බලා අදාළ සියලුම තොරතුරු සැපයීමට අයදුම්කරුවන් වග බලාගත යුතුය.

(iii) පහත සඳහන් ලේඛනවල පිටපත්, අයදුම්කරුවන් ස්වකීය අයදුම් පත්‍රවලට ඇමිණිය යුතුය. (1) ඉංග්‍රීසි, සිංහල, දෙමළ යන භාෂාවලින් සමත්වී ඇති උසස්ම විභාගය පිළිබඳ සහතිකය, (2) චරිත සහතිකය, (3) ඉල්ලා සිටින තනතුර සම්බන්ධයෙන් අදාළවන වෘත්තිය/ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(iv) ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසිවල 8 වැනි ඡේදය කෙරෙහි විශේෂ සැළකිල්ල යොමු කරන්න.

**..............තනතුර සඳහා වූ අයදුම් පත**

1. (අ) පුරප්පාඩුව ප්‍රසිද්ධකොට ඇති ගැසට් පත්‍රයේ දිනය :————

(ආ) ඉල්ලුම්කර සිටින තනතුර :————

2. සම්පූර්ණ නම පැහැදිලි අකුරෙන් :————
ජාතිය :————

(ඔබ ලියාපදිංචි වීමෙන් ලාංකිකයෙකු වී නම්, පුරවැසිභාවය පිළිබඳ සහතිකයේ දිනයත්, සැදැහුම් අංකයත් සඳහන් කරන්න).

3. තැපැල් ලිපිනය :————

(ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි).

4. (අ) අයදුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයට නියම වයස :—

අවුරුදු :———— මාස :———— දින :————

(ආ) උපන් දිනය :—

| අවුරුද්ද | මාසය | දිනය |
|---|---|---|
| | | |

5. උපන් ස්ථානය :—

(අ) අයදුම්කරු :————
(ආ) අයදුම්කරුගේ පියා :————
(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————
(ඈ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තා :————.

(අයදුම්කරු ශ්‍රී ලංකාවේ උපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ), (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුය. ඔහු ශ්‍රී ලංකාවේ නූපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඇ) හෝ (ආ) සහ (ඈ) පිරවිය යුතුය).

6. විවාහක ද ? අවිවාහක ද ? වැන්දඹු ද ? :————

7. වයස අවුරුදු 12 සිට ඉගෙන ගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :—

සාමාන්‍ය අධ්‍යාපනය

| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

වෘත්තිය/ශිල්පීය අධ්‍යාපනය

| විද්‍යායතනය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

8. අධ්‍යාපනික සුදුසුකම් :—

(අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය/අ.පො.ස. (සාමාන්‍ය පෙළ) :—

| | සමත්වූ වර්ෂය | විභාග අංකය | විෂයයන් | සම්මාන/විශිෂ්ඨ සාමාර්ථය |
|---|---|---|---|---|
| පළමුවෙනි වාරය | | | | |
| දෙවැනි වාරය | | | | |

(ආ) අ.පො.ස. (උසස් පෙළ)—

| සමත් වූ වර්ෂය | විභාග අංකය | විෂයයන් | සම්මාන/විශිෂ්ඨ සාමාර්ථය |
|---|---|---|---|
| | | | |

(ඇ) වෙනත් උසස් අධ්‍යාපනික සුදුසුකම්—

| විභාගයේ නම | සමත් වූ වර්ෂය | විභාග අංකය | විෂයයන් |
|---|---|---|---|
| | | | |

(ඈ) සමර්ථ වී ඇති උසස්ම විභාගය :—

(i) සිංහල :————
(ii) දෙමළ :————
(iii) ඉංග්‍රීසි :————

9. ලබාගෙන ඇති වෘත්තිය සහ ශිල්පීය සුදුසුකම් ලැබූ දින හා ආයතනවල නම් :————

10. වෘත්තිය/කාර්මික/කර්මාන්ත පළපුරුද්ද :—

| ආයතනයේ නම | ආධුනිකත්වයේ ස්වභාවය/ දරූ තනතුර. | සිට | දක්වා |
|---|---|---|---|
| | | | |

(සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි.)

11. (අ) පාඨශාලාවෙන් අස් වූ දින සිට කළ රක්ෂා (පත් වූ දිනයත් හා අස් වූ දිනයත් දක්වමින් දරූ තනතුරු සඳහන් කරන්න) :————.

(ආ) මීට පළමු, ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලනායතනයක් යටතේ ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් හෝ රක්ෂාවෙහි යෙදී සිටියේ නම් සහ ඒ සේවය නතර කිරීමට ඇති හේතු හා එසේ කළ දින පැහැදිලි වශයෙන් දක්වන්න :————.

(ඇ) පළාත් පාලන ආයතනවල සේවා කාලය පිළිබඳ සටහන් (තනතුරු) පළාත් පාලනායතන හා කාලසීමාවන් :————.

(ඈ) දනට කරන රක්ෂාව පහත සඳහන් විස්තර දෙන්න :—

(i) තනතුරේ පදවි නාමය, ශ්‍රේණිය හා ඊට පත් වූ දිනය :————.

(ii) දීමනා හැර දනට ලබන වැටුප හා වැටුප් ක්‍රමය :————.

(iii) විශ්‍රම වැටුප් සහිත ද ? :————.

(ඉ) සේවාමුක්ත භටයෙක් නම්, සේනාංකය, තරාතිරම, සේවයට බැඳුන දිනය හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

12. කියවීම, ලිවීම, කථා කිරීම, භාෂණ පරිවර්තනය පිළිබඳව ප්‍රවීනතාවක් ඇද්ද :—

(අ) සිංහල :————.

(ආ) දෙමළ :————.

13. විශේෂ සුදුසුකම්.—ගැසට් නිවේදනයෙහි සඳහන් කොට ඇති විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට තිබේද ? එසේ නම්, ඒ පිළිබඳව සම්පූර්ණ විස්තර, දින වකවානු සහිතව සඳහන් කරන්න :————.

14. කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේද ? එසේ නම් දිනය, නඩු අංකය හා වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

15. මුදල් කරදරවලින් නිදහස් ද ? එසේ නැත් නම්, ඔබේ ණය බැඳීම්වල ප්‍රමාණය කොපමණක් ද ? :————.

16. වෙනත් විස්තර (විශේෂ හිමිකම් ආදිය) :————.

17. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ පදවි නාම :———.

(ඉදිරිපත් කළ යුත්තේ ඒ සහතිකවල මුල් ලිපි නොව, පිටපත් පමණි. පළාත් පාලන සේවයේ උපලේඛනගත තනතුරු දරණ සාමාජිකයින් විසින් මේ නියමයේ ප්‍රකාර ක්‍රියා කළ යුතු නොවේ.)

මේ අයදුම් පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත් නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරාගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුව හොත්, මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත්, වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකළ හැකි බවත් මම දනිමි.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්.
තැ. පෙ. 530, කොළඹ 1.

---

## පළාත් පාලන සේවය

### මුද්‍රණාලයාධිපති (නාගරික මුද්‍රණාලය) තනතුර—(ඇස්) කොළඹ නාගරික සභාව

ඉහත සඳහන් තනතුර සඳහා පළාත් පාලන සේවා අධ්‍යක්ෂ විසින් අයදුම්පත්‍ර කැඳවයි.

2. වැටුප : තනතුරට නියමිත වැටුප් ක්‍රමය වර්ෂයකට රු. 6,600—8×180—3×240—රු. 8,760 වේ.

3. අවශ්‍ය සුදුසුකම් :

(අ) අයදුම්කරුවන් පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධරයන් විය යුතුවාත් හැර, මුද්‍රණ ශිල්පය හා චිත්‍ර සටහන් කලා පිළිබඳ ලන්ඩන් විද්‍යායතනයේ හෝ කාර්මික විද්‍යාව (මුද්‍රණ ශිල්පය) පිළිබඳ මැන්චෙස්ටර් විද්‍යාලයේ හෝ නගර හා කලා (මුද්‍රණ ශිල්පය) පිළිබඳ ලන්ඩන් ආයතනයේ හෝ ජ්‍යෙෂ්ඨ මුද්‍රණ ශිල්පීන්ගේ බ්‍රිතාන්‍ය ඒකාබද්ධ සංගමයේ ඩිප්ලෝමාව සහ සිංහල හා ඉංග්‍රීසි භාෂා පිළිබඳ හොඳ දැනුමක් තිබිය යුතුය ; නැත්නම්

(ආ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට උසස් විභාගයකින් හෝ සමත්ව පිළිගත් මුද්‍රණාලයක වගකිවයුතු තනතුරක අවුරුදු 10 කට නොඅඩු පළපුරුද්දක් ඇතිවිය යුතු අතර, මුද්‍රණ ශිල්පය හා චිත්‍ර සටහන් කලා පිළිබඳ ලන්ඩන් විද්‍යායතනයේ හෝ කාර්මික විද්‍යාව (මුද්‍රණ ශිල්පය) පිළිබඳ මැන්චෙස්ටර් විද්‍යාලයේ හෝ නගර සහ කලා (මුද්‍රණ ශිල්පය) පිළිබඳ ලන්ඩන් ආයතනයේ හෝ ජ්‍යෙෂ්ඨ මුද්‍රණ ශිල්පීන්ගේ බ්‍රිතාන්‍ය ඒකාබද්ධ සංගමයේ ඩිප්ලෝමාවක් සහ සිංහල සහ ඉංග්‍රීසි භාෂා පිළිබඳ හොඳ දැනුමක් තිබිය යුතුය ; නැත්නම්

(ඇ) කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් සමත්ව, පිළිගත් මුද්‍රණාලයක වග කිවයුතු තනතුරක අවුරුදු 15 කට නොඅඩු පළපුරුද්දක් ලබා සිටිය යුතු අතර, මුද්‍රණ ශිල්පය සහ චිත්‍ර සටහන් කලා පිළිබඳ ලන්ඩන් විද්‍යායතනයේ හෝ කාර්මික විද්‍යාව (මුද්‍රණ ශිල්පය) පිළිබඳ මැන්චෙස්ටර් විද්‍යාලයේ හෝ නගර සහ කලා (මුද්‍රණ ශිල්පය) පිළිබඳ ලන්ඩන් ආයතනයේ හෝ මුද්‍රණ ශිල්පීන්ගේ බ්‍රිතාන්‍ය ඒකාබද්ධ සංගමයේ ඩිප්ලෝමාවක් සහ සිංහල හා ඉංග්‍රීසි භාෂා පිළිබඳ හොඳ දැනුමක් තිබිය යුතුය.

4. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

5. ඉල්ලුම් පත්‍ර, පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව සාරානුකූලව පිළියෙල කොට, 1975. 06. 09 වැනි දිනට හෝ ඊට පළමු, පළාත් පාලන සේවා අධ්‍යක්ෂ වෙත ලැබෙන ලෙස එවිය යුතුයි.

6. අයදුම්පත්‍ර හෝ ඊට අදාළ අනිකුත් ලියුම් කියුම් එවිය යුත්තේ, පළාත් පාලන සේවා අධ්‍යක්ෂ වෙත මිස, මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොවේ.

7. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ සේවයේ හෝ පළාත් පාලනායතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත්‍ර භාරගනු ලබන්නේ, ඒවා ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත නියමිත දින හෝ ඊට ප්‍රථම භාරදී තිබී, ප්‍රමාදයට හේතු වූ පිළිගත හැකි කරුණු දක්වමින්, ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කලහොත් පමණි.

8. සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත්‍ර පමණක්. ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනයේ සිට දින 7ක් ඇතුලත ලැබුණු බව දන්වා එවනු ලැබේ.

ආර්. අබේරත්න,
පළාත් පාලන සේවා අධ්‍යක්ෂ.

1975 අප්‍රේල් මස 16 දින,
පළාත් පාලන සේවා දෙපාර්තමේන්තුව,
අංක 19, ලෝන්ඩන් පෙදෙස,
කොළඹ 7.

4-519 —75.04.24 දින අංක 161 දරණ ගැසට් පත්‍රය

---

## පළාත් පාලන සේවය

### ජලකර්මාන්ත පරීක්ෂක තනතුර

ඉහත සඳහන් තනතුර සඳහා පළාත් පාලන සේවා අධ්‍යක්ෂ අයදුම්පත් කැඳවයි.

2. වැටුප.—මෙම තනතුරට නියමිත ඒකාබද්ධ වැටුප් පරිමාණය වර්ෂයකට රුපියල් 4,152—144×17—සහ 180×8—රු. 8,040 කි. මෙම වැටුප් පරිමාණයෙහි වර්ෂයකට රු. 6,024 ට පෙර කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය්ය ද වර්ෂයකට රු. 7,500 ට පෙර කාර්යක්ෂමතා කඩඉමක් ද වේ. රජයේ සේවකයින්ට අදාල ප්‍රමාණ හා කොන්දේසි අනුව විවාහක දීමනාවක්ද, විවාහක නිලධාරීන්ට ගෙවනු ලැබේ.

3. පහත සඳහන් අයගෙන් පමණක් අයදුම්පත් භාරගනු ලැබේ :—

(අ) කොළඹ නාගරික සභාවේ ඉංජිනේරු ඕවර්සියර්වරුන් ; සහ

(ආ) කොළඹ නාගරික සභාවෙන් පිට ප්‍රාදේශීය බලමණ්ඩලයන්හි ජලකර්මාන්ත පරීක්ෂකවරුන් කර්මාන්ත අධිකාරිවරුන් සහ ජල කර්මාන්ත අධිකාරිවරුන්.

අයදුම්කරුවන්ට පහත සඳහන් සුදුසුකම් තිබිය යුතුයි :—

(i) සත් අවුරුද්දක ප්‍රායෝගික පළපුරුද්ද, යටත් පිරිසෙයින් එයින් අවුරුදු දෙකක් ජල කර්මාන්තය පිළිබඳව විය යුතුයි ; නැතහොත්

(ii) ජල කර්මාන්ත පිළිබඳව යටත් පිරිසෙයින් අවුරුදු 5ක පළපුරුද්ද.

අයදුම්කරුවනට පහත සඳහන් කාර්මික සුදුසුකම්වලින් ද එකක් වත් තිබිය යුතුයි :—

(අ) ලංකා කාර්මික විද්‍යාලයේ කණිෂ්ඨ කාර්මික නිලධාරි සහතිකය (සිවිල්) ;

(ආ) ලංකා කාර්මික විද්‍යාලයේ නාගරික ඉංජිනේරු ශිල්පය (තුන් අවුරුදු සන්ධ්‍යා පාඨමාලාව) පිළිබඳ අවසාන සහතිකය ;

(ඇ) ලංකා කාර්මික විද්‍යාලයේ ගොඩනැගිලි නිර්මාණය (තුන් අවුරුදු සන්ධ්‍යා කාල පාඨමාලාව) පිළිබඳ අවසාන සහතිකය ; නැතහොත්

(ඈ) වෙනත් සමාන සුදුසුකම්.

4. තෝරා ගන්නා ලද අයදුම් කරුවන්, කොළඹ නාගරික සභාවට පත් කරනු ලැබුවහොත්, කොළඹ නගරයේ සිට සැතපුම් 10ක අර්ධ

විෂ්කම්භය ඇතුලත පදිංචි වන ලෙස නියම කරනු ලබන අතර, ජල කර්මාන්ත ඉංජිනේරු තැන විසින් නියම කරනු ලබන පරිදි ඒ ඒ අවස්ථාවල ලබුගම හෝ කලටුවාවේ මූලස්ථානවල රාජකාරි ඉටු කිරීමට නියම කෙරේ.

5. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

6. ඉල්ලුම් පත්‍ර, පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙල කොට 1975.06.09 දිනට හෝ ඊට ප්‍රථම පළාත් පාලන සේවා අධ්‍යක්ෂ වෙත ලැබෙන ලෙස එවිය යුතුය.

7. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන පළාත් පාලන ආයතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම් පත්‍ර භාරගනු ලබන්නේ ඒවා පළාත් පාලන ආයතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත අයදුම්පත් භාරගනු ලැබූ අවසාන දින හෝ ඊට ප්‍රථම භාරදී තිබී, ප්‍රමාදයට හේතුවූ පිළිගත හැකි කරුණු දක්වමින්, ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණී.

8. සුදුසුකම් ඇති ඉල්ලුම් පත්‍ර පමණක් ලැබුණු බව දන්වා එවනු ලැබේ.

ආර්. අබේරත්න,
පළාත් පාලන සේවා අධ්‍යක්ෂ.

1975 අප්‍රේල් මස 16 වන දින,
තැ. පෙ. 530—කොළඹ 7,
අංක 19, ලොන්ඩන් පෙදෙස,
පළාත් පාලන සේවා දෙපාර්තමේන්තුවේදීය.

4–520—75.05.24 දින අංක 161 දරණ ගැසට් පත්‍රය

---

එගොඩපොත ගම්සභාව

(1) කාර්යාල කාර්ය සහායක තනතුර
(2) කසළ ශෝධන කම්කරු තනතුර

1. ඉහත සඳහන් තනතුරු සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ.

මැටුප් ක්‍රමය.—(1) කාර්යාල කාර්ය සහායක—වර්ෂයකට රු. 2,208—9×54—රු. 2,694.

(2) කසළ ශෝධක කම්කරු.—දෛනික වැටුප රු. 5.60.

2. අවශ්‍ය සුදුසුකම්.—(1) කාර්යාල කාර්ය සහායක.

(අ) අධ්‍යාපන සුදුසුකම්.—ජ්‍යෙ. පා. ස. හෝ විෂයයන් 6 කින් අ. පො. ස. (සා) සාමාර්ථය.

(ආ) වයස.—අවුරුදු 22ට අඩු නොවිය යුතු අතර 35ට වැඩි නොවිය යුතුය.

(2) වයස අවුරුදු 22ට අඩු නොවිය යුතු අතර 35ට වැඩි නොවිය යුතුය.

අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුත් අය විය යුතුය.

3. පළාත් පාලන සේවා සාමාජිකයින්ගේ හා ප්‍රාදේශීය බල මණ්ඩලවල ස්ථිර සේවකයින්ගේ අයදුම්පත් ඔවුන් අනෙකුත් සුදුසුකම් ලබා ඇත්නම් වයස පිළිබඳ නියමය නොතකා සලකා බලනු ලැබේ.

4. අයදුම්කරුවන් එගොඩපොත ගම්සභා සීමාවතුළ ස්ථිර පදිංචිකරුවන් විය යුතුය.

5. පත් කිරීම් සම්බන්ධයෙන් යෙදෙන මෙම ගැසට් පත්‍රයේ පළවී තිබෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ අයදුම් පත අනුව පිළියෙල කළ ඉල්ලුම් පත් 1975 මැයි 15 වැනි දින හෝ ඊට පෙර එගොඩපොත ගම්සභාවේ සභාපති වෙත ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය.

ඒ. යූ. විලියම් සිංඤෝ,
සභාපති,
එගොඩපොත ගම්සභාව.

1975 අප්‍රේල් 15 දින,
එගොඩපොත ගම්සභාව,
නිට්ටඹුව.

4–531—75.04.24 දින අංක 161 දරණ ගැසට් පත්‍රය.

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## පළාත් පාලන සේවය

මහජන සෞඛ්‍ය පරීක්ෂකයින් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගය, 1974.09.21 දින

යථෝක්ත විභාගයේ ප්‍රතිඵල පහත දක්වේ.

| විභාග අංකය | නම | සමත් වූ විෂයයන් |
|---|---|---|
| 2 | *ඒ. මු. පූ. ඒකනායක | ප්‍රායෝගික |
| 3 | සී. ආ. ගුණරත්න | වාචික |
| 4 | දූ. න. ජයසූරිය | ප්‍රායෝගික, වාචික |
| 6 | ද. ග. නාමවර්ධන | ලිඛිත |
| 7 | †ප. වි. සු. ප්‍රේමචන්ද්‍ර | ලිඛිත, ප්‍රායෝගික, වාචික |
| 8 | ග. ර. පෙරේරා | ලිඛිත, ප්‍රායෝගික |
| 9 | *හෙ. වි. පියසේන | ලිඛිත |
| 10 | හේ. බා. මු. සිරිවර්ධන | ලිඛිත, වාචික |
| 11 | අ. ම. මො. නහීර් | ප්‍රායෝගික, වාචික |
| 12 | සා. හ. මො. තවුපික් | ප්‍රායෝගික, වාචික |
| 13 | *වෙ. ක. විජයසුන්දර | ලිඛිත, ප්‍රායෝගික, වාචික |
| 14 | *ය. විමලසේන | ලිඛිත, ප්‍රායෝගික, වාචික |
| 15 | *ප. ප. මැ. යසපාල | ලිඛිත, ප්‍රායෝගික, වාචික |

* මෙ අය විභාගය සම්පූර්ණ කර තිබේ.

† මෙ අය කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් වීම සඳහා 50% ක මුළු ලකුණු ප්‍රමාණය ලබාගෙන නැත.

ආර්. අබේරත්න,
පළාත් පාලන සේවා අධ්‍යක්ෂ.

19, ලෝඩන් පෙදෙස,
කොළඹ 7, 75.04.15.

4–528—75.05.24 දින අංක 161 දරණ ගැසට් පත්‍රය

---

# අතුරු ව්‍යවස්ථා

## වත්තල—මාබෝල නගර සභාව

### නගර සභා ආඥාපනත

(255 වැනි අධිකාරය වන) නගර සභා ආඥාපනතේ 153 සහ 157 වැනි වගන්තීන් යටතේ ඒ සඳහා උචිත බලධරයා වන වත්තල-මාබෝලෙ නගර සභාව විසින් සාදනු ලදුව එම ආඥාපනතේ 154 වැනි වගන්තිය යටතේ රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු භාර ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

ඩී. රාජේන්ද්‍ර,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ
කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්.

කොළඹදී ය, 1975.04.09.

### ගොඩනැගිලි සැලසුම් පරීක්ෂා කිරීම හා සලකා බැලීමට අදාල අතුරු ව්‍යවස්ථා

1. අළුතින් ගොඩනැගිලි ඉදිකිරීම සඳහා හෝ පවත්නා ගොඩනැගිලි වෙනස් කිරීම සඳහා හෝ (268 වැනි අධිකාරය වන) නිවාස හා නගර සංවර්ධන ආඥාපනතේ විධිවිධාන යටතේ ඉදිරිපත් කරනු ලබන සැලසුම් පරීක්ෂා කර බැලීම හා සලකා බැලීම සම්බන්ධයෙන් මේ සමග ඇති උපලේඛනයේ නියමිත ගාස්තු ප්‍රමාණයන්ට අනුව, නිගමනය කරනු ලබන ගාස්තුවක් ගෙවිය යුතුය.

2. 1 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ ගෙවිය යුතු ගාස්තුව ගෙවන ලෙස නියම කරමින් වත්තල-මාබෝලෙ නගර සභාවේ සභාපතිතුමා ගෙන් ලිපියක් ලැබුණු විට සභාපතිතුමාගේ අනුමැතිය හෝ කැමැත්ත සඳහා අයදුම් පත ඉදිරිපත් කරන්නා විසින් එම ගාස්තුව ගෙවිය යුතුය. එම ගාස්තුව ගෙවන තුරු කිසිම සැලැස්මක් පරීක්ෂා කිරීම හෝ සලකා බැලීම හෝ නොකළ යුතුය.

උපලේඛනය

(1) අළුතින් ගොඩනැගිලි ඉදිකිරීම සම්බන්ධයෙන් හෝ පවතින ගොඩනැගිල්ලක ගෙබිමේ වර්ග ප්‍රමාණය වැඩිවන අයුරු එය වෙනස් කිරීම සම්බන්ධයෙන් හෝ ඉදිරිපත් කෙරෙන සැලසුම් සඳහා :—

| | රු. | ශ. |
|---|---|---|
| (අ) ගෙබිමේ සම්පූර්ණ වර්ග ප්‍රමාණය වර්ග අඩි 600 කට වැඩි නොවන කල්හි ... | 5 | 0 |
| (ආ) ගෙබිමේ සම්පූර්ණ වර්ග ප්‍රමාණය වර්ග අඩි 600 ට වැඩි නමුත්, වර්ග අඩි 1,000 කට වැඩි නොවන කල්හි ... ... | 25 | 0 |
| (ඉ) ගෙබිමේ සම්පූර්ණ වර්ග ප්‍රමාණය වර්ග අඩි 1,000 කට වැඩි වන නමුත්, වර්ග අඩි 2,000 කට වැඩි නොවන කල්හි ... | 50 | 0 |
| 2. වලංගු කාලය අවසන් වූ ගොඩනැගිලි බලපත්‍රයක්, (නැවතත් ගොඩනැගිලි ඉල්ලුම් පතක් ඉදිරිපත් නොකොට) එක් අවුරුදු කාලසීමාවකට දීර්ඝ කර ගැනීම සඳහා වූ ඉල්ලුම් පතක් වෙනුවෙන් ... | 2 | 50 |

මෙම උපලේඛනයෙහි "ගෙබිම" යන්නෙන් බිම් මාලයෙහි හෝ වෙනත් මාලයක බිම ඉඩකඩ අදහස් වේ.

4-458—75.05.24 දින අංක 161 දරණ ගැසට් පත්‍රය

---

# ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන

**1974 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා කැගල්ල නගර සභාවේ සාමාන්‍ය අංශයේ ආදායම හා වියදම ගිණුම**

| වියදම | රු. ශ. | ආදායම | රු. ශ. |
|---|---|---|---|
| 1. පොදු පරිපාලනය හා කාර්ය මණ්ඩ සේවා ... | 1,60,876 60 | 1. පොදු පරිපාලනය ... ... ... | 3,78,805 68 |
| 2. සෞඛ්‍ය සේවාවන් ... ... | 2,01,472 11 | 2. සෞඛ්‍ය සේවාවන් ... ... | 39,309 84 |
| 3. භෞතික සැලසුම, මංමාවත්, ඉඩම් සහ ගොඩනැගිලි ... | 1,13,707 79 | 3. භෞතික සැලසුම, මංමාවත්, ඉඩම් සහ ගොඩනැගිලි ... | 72,823 01 |
| 4. ජල සේවා ... ... | 61,797 92 | 4. ජල සේවා ... ... ... | — |
| 5. වෙනත් පොදු ආවශ්‍යක සේවා ... ... | 1,48,974 04 | 5. වෙනත් පොදු ආවශ්‍යක සේවා ... ... | 72,603 52 |
| 6. සුභ සාධක සේවා සහ පහසුකම් ... ... | 30,718 91 | 6. සුභ සාධක සේවා සහ පහසුකම් ... ... | 1,08,917 35 |
| | | ඌනතාවය ... ... ... | 45,087 97 |
| | 7,17,547 37 | | 7,17,547 37 |

**1974 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා කැගල්ල නගර සභාවේ විදුලිය අංශයේ ආදායම සහ වියදම ගිණුම**

| වියදම | රු. ශ. | ආදායම | රු. ශ. |
|---|---|---|---|
| විදුලිය වියදම ... ... ... | 4,56,119 94 | විදුලිය ආදායම ... ... ... | 5,06,635 97 |
| අතිරික්තය ... ... ... | 50,516 03 | | |
| | 5,06,635 97 | | 5,06,635 97 |

කැගල්ල නගරසභාවේ 1974 දෙසැම්බර් 31 වෙනි දිනට අවසන් වර්ෂයේ පූර්වෝක්ත ආදායම හා වියදම ගිණුම, එම සභාවේ සභාපති වූ පු. බ. බාලසූරිය වන මම මගේ උපරිම දැනීමේ හා විශ්වාසයේ අන්දමට නිවරද හා සත්‍ය බව මෙයින් සහතික කරමි.

පු. බ. බාලසූරිය,
සභාපති,
කැගල්ල, නගර සභාව.

1975.04.09.

නිවැරදි බවට සහතික කරමි.

පී. ඩබ්ලිව්. අබේරත්න,
නගර සභික,
කැගල්ල, නගර සභාව.

1975.04.09 දින මා ඉදිරිපිට දී සහතික කරන ලදී.

පී. රාජකරුණා,
සාමදාන විනිසුරු.

## 1974 දෙසැම්බර් මස 31 වැනි දිනට කෑගල්ල නගර සභාවේ ශේෂ පත්‍රය

| බැරකම් | | | සාමාන්‍ය | විදුලිය | එකතුව |
|---|---|---|---|---|---|
| | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| ප්‍රාග්ධන ගිණුම | | | 1,07,357 95 | 60,281 50 | 1,67,639 45 |
| දිගුකල් බැරකම්— | | | | | |
| දේ. ණ. සහ සං. අරමුදල (වැය කළ) | | | 29,24,013 60 | 1,22,990 51 | 30,47,004 11 |
| දේ. ණ. සහ සං. අරමුදල (වැය නොකළ) | | | 22,00,432 80 | — | 22,00,432 80 |
| ප්‍රවර්ථන බැරකම් : | | | | | |
| විවිධ ණය හිමියෝ | | | 2,09,550 54 | 93,889 64 | 3,03,440 18 |
| රජයේ ආධාර : | | | | | |
| තානායම වැඩි දියුණු | | | 1,826 02 | — | 1,826 02 |
| මුඩුක්කු සංහාර නිවාස යෝජනා ක්‍රම | | | 54,000 0 | — | 54,000 0 |
| මතුපිට කාණු ක්‍රමය | | | 873 50 | — | 873 50 |
| ක්‍රීඩාපිටිය වැඩි දියුණුව | | | 146 75 | — | 146 75 |
| ප්‍රජා මණ්ඩල | | | 50 0 | — | 50 0 |
| තැන්පත් | | | 1,52,937 02 | 1,11,505 90 | 2,64,442 92 |
| ක්ෂය සංචිත | | | 4,835 0 | 17,750 0 | 22,585 0 |
| ණය ගිණුම | | | 11,243 41 | — | 11,243 41 |
| පොදු අරමුදල (සාමාන්‍ය) | | | | | |
| 74.01.01 අතිරික්තය | | 2,29,211 39 | | | |
| එකතුවීම වර්ෂ තුල | | 16,601 14 | | | |
| | | 2,45,812 53 | | | |
| අඩුවීම වර්ෂය තුල | | 3,707 73 | | | |
| | | 2,42,104 80 | | | |
| 1974.12.31 දක්වා ආදයම | | 6,72,459 40 | | | |
| | | 9,14,564 20 | | | |
| 1974.12.31 දක්වා වියදම් | | 7,17,547 37 | | | |
| | | | 1,97,016 83 | — | 1,97,016 83 |
| පොදු අරමුදල (විදුලිය) | | | | | |
| 74.12.31 දක්වා ආදයම | | 5,06,635 97 | | | |
| 74.01.01 ඌනතාවය | 11,350 21 | | | | |
| 74.12.31 දක්වා වියදම | 4,56,119 94 | | | | |
| | | 4,67,470 15 | | | |
| | | | — | 39,165 82 | 39,165 82 |
| | | | 58,64,283 42 | 4,45,583 37 | 63,09,866 79 |

| වත්කම් | සාමාන්‍ය | විදුලිය | එකතුව |
|---|---|---|---|
| | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| ස්ථාවර වත්කම් : | | | |
| මෝටර් වාහන | 42,000 0 | — | 42,000 0 |
| කාර්යාලීය උපකරණ | 65,357 95 | 60,281 50 | 1,25,639 45 |
| ණය යෝජනා ක්‍රම | 29,24,013 60 | 1,22,990 51 | 30,47,004 11 |
| ආයෝජන : | | | |
| ස්ථාවර තැන්පත් | 74,409 35 | — | 74,409 35 |
| තැ. කා. ඉතිරි කිරීමේ ගිණුම | 12,195 30 | — | 12,195 30 |
| ප්‍රවර්ථන වත්කම් : | | | |
| දේපල බදු | 1,61,561 97 | — | 1,61,561 97 |
| නිවාස කුළී | 17,468 36 | — | 17,468 36 |
| වෙළඳ පොල කුළී | 11,034 90 | — | 11,034 90 |
| විදුලි බල ගාස්තු | — | 95,243 84 | 95,243 84 |
| විවිධ ණය ගැතියෝ | 2,01,899 98 | 77,728 19 | 2,79,628 17 |
| ගබඩා අත්තිකාරම් | 5,083 53 | 66,601 83 | 71,685 36 |
| අත්තික රම් | 10,889 12 | 1,970 0 | 12,859 12 |
| ජල යෝජනා ක්‍රම (ජල ප්‍රවාහන අධ්‍යක්ෂ) | 22,00,000 0 | — | 22,00,000 0 |
| මුදල් ශේෂය | 1,38,369 36 | 20,767 50 | 1,59,136 86 |
| | 58,64,283 42 | 4,45,583 37 | 63,09,866 79 |

කෑගල්ල නගර සභාවේ 1974 දෙසැම්බර් මස 31 දිනට දක්වෙන පූර්වොක්ත ශේෂ පත්‍රය, මෙම නගර සභාවේ සභාපති වූ පු. බ. බාලසූරිය වන මම මාගේ උපරිම දැනීමේ හා විශ්වාසයේ අන්දමට නිවරද හා සත්‍ය බව මෙයින් ද සහතික කරමි.

පු. බ. බාලසූරිය,
සභාපති,
කෑගල්ල, නගර සභාව.

පී. ඩබ්ලිව්. අබේරත්න,
නගර සභික,
කෑගල්ල නගර සභාව.

1975.04.09.

1975.04.09 දින මා ඉදිරිපිට දී සහතික කරන ලදී.

පී. රාජකරුණා,
සාමදාන විනිසුරු.

4-393—75.04.24 දින අංක 161 දරන ගැසට් පත්‍රය

# අය - වැය ලේඛන.

## පට්ටිපොල කෝරළේ ගම්සභාව—ලුනුගල

### 1975 වර්ෂයේ අය වැය ලේඛනය

බදුල්ල දිස්ත්‍රික්කයේ පට්ටිපොල කෝරලේ ගම්සභාව විසින් 1975 වර්ෂය සඳහා සම්මත කරගන්නා ලද අය වැය ලේඛනය මෙයින් ප්‍රකාශයට පත් කරමි.

චන්ද්‍රදාස රත්නායක,
සභාපති, පට්ටිපොල ගම් සභාව,
ලුනුගල.

1975 අප්‍රේල් මස 08 දින,
පට්ටිපොල කෝරළේ ගම්සභා කායර්ාලයේදිය,
ලුනුගල.

### 1975 වර්ෂයට ගණන් බලන ලද ආදයම්

| | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| 1. අක්කර බදු ... ... | | 6,675 49 |
| 2. වෙළඳ බලපත්‍ර ගාස්තු ... ... | | 2,800 0 |
| 3. වාහන හා සත්ව බද්ද ... ... | | 135 0 |
| **වෙනත් ආදයම් :** | | |
| වාහන අත්තිකාරම් පොලී ... ... | | 25 80 |
| දඩ මුදල් ... ... ... | | 100 0 |
| විකුණුම් ... ... ... | | 216 0 |
| ගාස්තු ... ... ... | | 230 0 |
| **ආපසු ගෙවීම් :** | | |
| (i) මුද්දර ගාස්තු (ඉඩම් හුවමාරු) ... | | 3,570 0 |
| (ii) තුවක්කු බ.ප. ගා. හා ඉන්ධන ... | | 300 0 |
| **රජයේ ආධාර :** | | |
| දීමනා—මාතෘධාරක ආධාර ... ... | 2,370 0 | |
| ඇඟ බද්ද සඳහා ආධාර ... ... | 536 88 | |
| ප්‍රජා මණ්ඩල සඳහා ... ... | 500 0 | |
| කසල ශෝධන ආධාර ... ... | 235 0 | |
| | | 3,641 88 |
| **ප්‍රතිපූරණ :** | | |
| නිළධාරි හා කම්කරු වැටුප් ... ... | 14,470 40 | |
| විශේෂ දීමනා ... ... | 3,393 28 | |
| | | 20,359 68 |
| **වෙනත් ලැබීම් :** | | |
| නිශ්චිත දීමනා—කර්මාන්ත ආධාර ... | | 16,501 0 |
| | | 54,554 85 |
| 1974 වර්ෂය අවසානයට ඉතිරි වෙයයි ගණන් බැලූ මුදල | | 8,032 84 |
| එකතුව ... | | 62,587 69 |

ඉහත සඳහන් විස්තර සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි.

චන්ද්‍රදස රත්නායක්,
සභාපති,
පට්ටිපොල ගම්සභාව.

### 1975 වර්ෂයට ගණන් බලන ලද වියදම

| | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| 1. පරිපාලනය : | | |
| (i) වේතන හා වැටුප්—ලිපිකරු ... | 3,000 0 | |
| කා.කා.ස. ... ... | 2,316 0 | |
| ග. මුලාදැනි ... ... | 2,316 0 | |
| | | 7,632 0 |
| (ii) ගාස්තු හා කොමිස්— ... | | |
| ලිපිකරු 20% ... ... | 600 0 | |
| ලිපිකරු විවාහ දීමනා ... ... | 600 0 | |
| ලිපිකරු මුදල් පරිහරණ ... ... | 60 0 | |
| ග.මු. 20% ... ... | 553 20 | |
| කා.කා.ස. 20% ... ... | 553 20 | |
| කා.කා.ස. විවාහ දීමනා ... ... | 60 0 | |
| | | 2,426 40 |
| (iii) ගමන් වියදම් — | | |
| නිළධාරි, සභාපති තුමා ... ... | 1,832 0 | |
| මාසික ස්ථිර ගමන් වියදම් ... | 168 0 | |
| නිවාඩු කාලයේ ගමන් වියදම් ... | 100 0 | |
| | | 2,100 0 |
| (iv) විශ්‍රාම අර්ථ සාධක හා පා. දීමනා | | |
| ලිපිකරු ... ... ... | 290 0 | |
| කා.කා.ස. හා ග.මු. ... ... | 416 88 | |
| විශ්‍රාමිකයන්ට ... ... | 891 72 | |
| විශ්‍රාමිකයන්ට ආහාර දීමනා ... | 240 0 | |
| විශ්‍රාමිකයන්ට ගෙවිය යුතු හිඟ ආදියට ... | 161 0 | |
| | | 2,000 0 |
| (v) නීති, විගණක ගාස්තු— | | |
| නීතිඥ වියදම් ... ... | 500 0 | |
| විගණන ගාස්තු ... ... | 450 0 | |
| | | 950 0 |
| (vi) ලිපි ද්‍රව්‍ය සඳහා ... ... | | 1,000 0 |
| (vii) ගෙවල් කුලී ... ... | | 258 12 |
| (viii) කාර්යාල වියදම්—බැංකු හර බදු, දුර කථන බිල්, වාර්ෂික දුර කථන, අත් මුදල්, ආදිය ... ... ... | | 1,750 0 |
| (ix) ගබඩා ද්‍රව්‍ය සඳහා—කායර්ාල උපකරණ ... | | 1,000 0 |
| (x) දීමනා හා පරිත්‍යාග—ගම්සභා සම්මේලන වාර්ෂික ගාස්තු හා අනිකුත් සංවිධාන සඳහා දීමනා ... ... ... | | 100 0 |
| (xi) විවිධ වියදම් ... ... | | 500 0 |
| සෞඛ්‍යය : | | |
| (i) වේතන හා වැටුප්—තාවකාලික වැසිකිළි කම්කරු ... ... | | 710 40 |
| (ii) ගාස්තු හා කොමිස්—තාවකාලික වැසිකිළි කම්කරු 20% ... ... | | 142 08 |
| (iii) කිරි ආහාර සඳහා ... ... | | 4,000 0 |
| (iv) ගබඩා ද්‍රව්‍ය—වැසිකිළි උපකරණ ... | | 100 0 |
| (v) මහජන දේපල නඩත්තුව—සෞඛ්‍යාරක්ෂක උපකරන ... ... | | 200 0 |
| නඩත්තු කිරීම— | | |
| (i) වේතන හා වැටුප්—මාර්ග කම්කරුවන් 4ට | | 8,238 0 |
| (ii) ගාස්තු හා කොමිස්—20%දීමනාව හා විවාහ දීමනා ... ... | | 2,247 60 |
| (iii) අර්ථ සාධක අරමුදලට ... | | 1,235 52 |
| (iv) ගබඩා ද්‍රව්‍ය—උපකරණ හා මෙවලම් ආදිය | | 100 0 |
| (v) මහජන දේපල නඩත්තුව—පාරවල්, පාලම් බෝක්කු ආදිය සෑදීම සඳහා ... | | 3,000 0 |
| ජලය සැපයීම— | | |
| ගබඩා ද්‍රව්‍ය—නඩත්තු උපකරණ ... | | 200 0 |
| මහජන දේපල නඩත්තුව—ජලසේවා සඳහා ... | | 1,500 0 |
| සුභ සාධනය— | | |
| දීමනා හා පරිත්‍යාග—පාසල් පොත් ... | 2,000 0 | |
| ප්‍රජා මණ්ඩල ... | 500 0 | |
| | | 2,500 0 |
| ප්‍රාග්ධන වියදම්— | | |
| 1975 රජයේ ආධාර කර්මාන්ත සඳහා ... | | 16,501 0 |
| මුලු එකතුව ... | | 60,391 12 |

ඉහත සඳහන් විස්තර නිවැරදි බවට සහතික කරමි.

චන්ද්‍රදාස රත්නායක,
සභ.පති,
පට්ටිපොල ගම්සභාව.

4–439—75.04.24 දින අංක 161 දරන ගැසට් පත්‍රය

## රිල්පොල ගම්සභාවේ 1975 වර්ෂයේ අයවැය ලේඛණය

### ඇස්තමේන්තු ආදයම

| | අයවැය ගත ගණන් රු. ශ. |
|---|---|
| **ආදායම් වෙනුවෙන් ලැබීම් :** | |
| 1. වරිපනම් බදු හා බදු කුලී (අධිගාස්තු ඇතුළුව) — | |
| (1) වරිපනම | 765 0 |
| (2) බ (අක්කර බදු) | 10,200 0 |
| (3) බදු කුලී | — |
| 2. බලපත්‍ර ගාස්තු— | |
| (1) වෙළඳ | 5,000 0 |
| (2) වාහන | 90 0 |
| (3) මස්කඩ | — |
| (4) වෙන්දේසි කරුවන් හා බ්‍රෝකර්වරු | — |
| (5) මහජන ප්‍රදර්ශන | — |
| (6) වෙළඳ සැල් හා පොලවල් | — |
| 3. වෙනත් ආදායම— | |
| (1) පොලී | 60 0 |
| (2) දඩ | 200 0 |
| (3) විකුණුම් | 150 0 |
| (4) ගාස්තු | 200 0 |
| (5) බදු (දිසාපතිගෙන් ලැබීම) | 200 0 |
| (6) ආපසු ගෙවීම් | 500 0 |
| (7) වෙළඳ පොල ගාස්තු | — |
| 4. රජයේ ආධාර— | |
| (1) දීමනා | 3,644 62 |
| (2) ප්‍රතිපූර්ණ | 34,375 0 |
| 5. විදුලිය— | |
| (1) විකුණුම් | — |
| (2) පාරිභෝගිකයින්ට කළ සේවා | — |
| (3) විවිධ ලැබීම් | — |
| **ප්‍රාග්ධන වෙනත් ලැබීම් :** | |
| 1. නිශ්චිත දීමනා | 29,000 0 |
| 2. ණය | — |
| 3. වෙනත් (1974.12.31 දිනට ඉතිරිය) | 5,296 34 |
| එකතුව | 89,680 96 |

### ඇස්තමේන්තු වියදම

